# PUBLIC NOTICE

## Revision of Fee Collection for Pharmacy Applications with Amendments

The National Medicines Regulatory Authority (NMRA) wishes to inform all applicants that, in accordance with the decision of the NMRA Management Meeting held on **05 May 2026**, the following fee policy shall apply **with effect from 05 May 2026**:

- The **USD 90 processing fee** paid at the time of submitting a pharmacy application shall remain **valid for a period of three (03) years** from the date of payment.
- During this three-year validity period, applicants requesting amendments to an approved pharmacy application or licence shall **only be required to pay the applicable amendment fee** prescribed in the relevant Gazette Extraordinary.
- **No additional USD 90 processing fee** shall be charged for amendment applications submitted within the above three-year validity period.
- Any amendment application submitted **on or after 05 May 2026** that was charged an additional USD 90 processing fee, despite the original processing fee remaining valid, will be reviewed by the Pharmacy Regulatory Division. Any necessary corrective action will be taken in accordance with the decision of the Authority.

This decision has been made to ensure the uniform implementation of the approved fee structure and the consistent application of the provisions of the applicable Gazette.

Applicants requiring further information may contact the **Pharmacy Regulatory Division** through the official NMRA communication channels.

**This notice is effective from 05 May 2026.**

**Pharmacy Regulatory Division**
**National Medicines Regulatory Authority (NMRA)**
**Date of Issue: 08.07.2026**

# <u>මහජන නිවේදනයයි</u>

## ඖෂධශාලා අයදුම්පත්වල සංශෝධන (Amendments) සඳහා අයකරනු ලබන ගාස්තු පිළිබඳ නිවේදනයයි.

2026 මැයි මස 05 වන දින පැවති ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) කළමනාකරණ රැස්වීමේදී ගනු ලැබූ තීරණයට අනුව, **2026 මැයි මස 05** වන දින සිට බලපැවැත්වෙන පරිදි, ඖෂධශාලා අයදුම්පත් සඳහා අදාළ ගාස්තු අයකිරීම පහත පරිදි ක්‍රියාත්මක කරනු ලැබේ.

01. ඖෂධශාලා අයදුම්පතක් ඉදිරිපත් කිරීමේදී ගෙවනු ලබන ඇමෙරිකානු ඩොලර් 90 **(USD 90)ක සැකසුම් ගාස්තුව**, ගෙවූ දිනයේ සිට වසර තුනක (03) කාලයක් සඳහා වලංගු වේ.

02. එම වසර 03ක වලංගු කාලය තුළ අනුමත අයදුම්පතකට හෝ බලපත්‍රයකට සංශෝධනයක් (Amendment) සිදු කිරීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් සම්බන්ධයෙන්, **අදාළ ගැසට් පත්‍රයේ නියම කර ඇති සංශෝධන ගාස්තුව (Amendment Fee) පමණක්** අය කරනු ලැබේ.

03. එම වසර 03ක වලංගු කාලය වලංගු කාලය තුළ ඉදිරිපත් කරන සංශෝධන අයදුම්පත් සඳහා වන **USD 90ක සැකසුම් ගාස්තුව නැවත අය නොකෙරේ.**

04. **2026 මැයි මස 05 වන දින හෝ ඉන් පසුව** ඉදිරිපත් කරන ලද සංශෝධන අයදුම්පතක් සඳහා, පෙර ගෙවූ සැකසුම් ගාස්තුව තවදුරටත් වලංගු වුවද අමතර USD 90ක සැකසුම් ගාස්තුවක් අය කර ඇත්නම්, ඒ සම්බන්ධයෙන් ඖෂධශාලා නියාමන අංශය විසින් සමාලෝචනය කර, අධිකාරියේ තීරණයට අනුකූලව අවශ්‍ය පියවර ගනු ලැබේ.

ඔසුසල් බලපත්‍ර සම්බන්ධයෙන් අදාළ ගාස්තු අය කිරීම ඒකාකාරීව ක්‍රියාත්මක කිරීම සහ අදාළ ගැසට් පත්‍රයේ විධිවිධාන නිසි පරිදි ක්‍රියාත්මක කිරීමේ අරමුණින් මෙම තීරණය ගන්නා ලදී.

වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ **ඖෂධශාලා නියාමන අංශය** සමඟ නිල සන්නිවේදන මාර්ග ඔස්සේ සම්බන්ධ විය හැකි බව දන්වා සිටිමි.

**මෙම නිවේදනය 2026 මැයි මස 05 වන දින සිට බලපැවැත්වේ.**

**ඖෂධශාලා නියාමන අංශය**
**ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA)**
**නිකුත් කළ දිනය : 08.07.2026**